# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2147/71 - 2019 ඔක්තෝබර් මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2019.10.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ, මඩුල්කැලේ සේවා ජලාශය හා ප්‍රවේශ මාර්ගය ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය ව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 24 වැනි දින,
බත්තරමුල්ල, පැලවත්ත,
නව පාර්ලිමේන්තු පාර,
අංක 35හි පිහිටි
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1524

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 731, මඩුල්කැලේ, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මඩුල්කැලේ ගමේ පිහිටි, ''මඩුල්කැලේ වතුයාය (පහළ කොටස)'' නැමති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි රූඩ් 01 පර්චස් 08 ක් පමණ වන ඉඩම් කොටස :

ඉඩමේ නම : මඩුල්කැලේ වතුයාය (පහළ කොටස)
ප්‍රමාණය : රූඩ් 01 පර්චස් 08


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මායිම්

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස (ක්ෂේත්‍ර අංක 14) හා මඩුල්කැලේ - කබරගල මාර්ගය ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස (ක්ෂේත්‍ර අංක 14) හා මඩුල්කැලේ - කබරගල මාර්ගය ;
*දකුණට* : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ජල ටැංකිය ඉදි කොට ඇති ඉඩම හා මෙම ඉඩමේ ඉතිරි කොටස (ක්ෂේත්‍ර අංක 14) ;
*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස (ක්ෂේත්‍ර අංක 14)

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්* : 01. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,
අංක 21, බී. සී. සී. පරිශ්‍රය,
මිරානියා වීදිය,
කොළඹ 12.

02. උඩපුස්සැල්ලාව ප්ලාන්ටේෂන් (පී.එල්.සී.),
අංක 1/95, නම්බපාන,
ඉංගිරිය.

11 - 1124

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ පොළොන්නරුව අපජල එකතු කිරීම හා බැහැර කිරීමේ ව්‍යාපෘතියේ පොම්පාගාර අංක 04 ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 24 වැනි දින,
බත්තරමුල්ල, පැලවත්ත,
නව පාර්ලිමේන්තු පාර,
අංක 35හි පිහිටි
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1522

**උපලේඛනය**

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 183, බටහිර කඳුරුවෙල, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කඳුරුවෙල ගමේ පිහිටි, පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 10 ක් පමණ වන ඉඩම් කොටස.

මායිම්

*උතුරට* : අතහැර දමා ඇති ගොඩනැගිල්ල සහිත මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : වරිපනම් අංක 399 දරන ගොඩනැගිල්ල ;
*බටහිරට* : පෞද්ගලික පාර.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : හිමිකරු සොයා ගත නොහැකිය.

11 - 1125

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජලසම්පාදන ජලාපවහන මණ්ඩලයේ, කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ, දෙගල්දොරුව සේවා ජලාශය හා පොම්පාගාරය ඉදි කිරීම සඳහා විකල්ප ඉඩම් කොටස් අත්කර ගැනීමට අවශ්‍ය ව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස් වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 24 වැනි දින,
බත්තරමුල්ල, පැලවත්ත,
නව පාර්ලිමේන්තු පාර,
අංක 35හි පිහිටි
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1523

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 659, දීකිරිමඩවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ යක්ගහපිටිය ගමේ පිහිටි, බලය ලත් මිනින්දෝරු ඩී. එම්. ජයරත්න මහතා විසින් මැන සකස් කරන ලද අංක 1038 දරන මිනින්දෝරු සැලැස්මේ, කැබලි අංක 4 හා 5 වශයෙන් දැක්වෙන ''අධිකාරම් වත්ත'' නැමති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් රූඩ් 01 පර්චස් 36.39 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙක.

කැබලි අංක : 4
ප්‍රමාණය : පර්චස් 12.02

මායිම්

*උතුරට* : මාර්ගය (ප්‍රාදේශීය සභා) හා මෙම සැලැස්මේ කැබලි අංක 3 දරන ඉඩම් කොටස ;
*නැගෙනහිරට* : නෙල්ලිගහ කොටුව ;
*දකුණට* : නෙල්ලිගහ කොටුව සහ මෙම සැලැස්මේ කැබලි අංක 5 දරන ඉඩම් කොටස ;
*බටහිරට* : මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ කාණුව.

කැබලි අංක : 5
ප්‍රමාණය : රූඩ් 01 පර්චස් 24.37

මායිම්

*උතුරට* : මාර්ගය (ප්‍රාදේශීය සභා) හා මෙම සැලැස්මේ කැබලි අංක 4 දරන ඉඩම් කොටස ;
*නැගෙනහිරට* : මෙම සැලැස්මේ කැබලි අංක 7 (කාණුව) සහ නෙල්ලිගහ කොටුව ;
*දකුණට* : තිලකරත්න මහතා සහ තවත් අය හිමිකම් කියන අධිකාරම් වත්ත හා මෙම සැලැස්මේ කැබලි අංක 6 (කාණුව) ;
*බටහිරට* : තිලකරත්න මහතා හා තවත් අය හිමිකම් කියන අධිකාරම් වත්ත, මෙම සැලැස්මේ කැබලි අංක 6 (කාණුව) සහ අංක 1637 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 1-G දරන ඉඩම් කොටස.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්* :

01. ඊ. එම්. කමල් දේශප්‍රිය ඒකනායක මහතා,
අංක 66/2, ගොඩගන්දෙණිය,
පේරාදෙණිය.

02. දේමුණි ප්‍රසාන් සංජය ද සිල්වා මහතා,
''ප්‍රසාන්'',
ගම්මැද්දේගොඩ,
රත්ගම.

03. ජී. ජී. ජයසිංහ මහතා,
අංක 22/1, වරකාගොඩ,
පිළිමතලාව.

11 - 1126

## ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, 2018.03.21 දිනැති අංක 2063/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 2A පිටුවේ අංක 04-197 යටතේ පළ කරන ලද නිවේදනයේ උප ලේඛනයෙහි මායිම් පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

1. කැබලි අංක : 1
   ඉඩමේ ප්‍රමාණය : පර්චස් 07

   *උතුරට* : අංක 320301 දරන කැඩැස්තර සිතියමෙහි අත්පත් කර ගැනීමට යෝජිත කැබලි අංක 50 හි ඉතිරි කොටස හා කැබලි අංක 53 (මාර්ගය) ;
   *නැගෙනහිරට* : ගුරුදෙණිය - දඹවෙල මාර්ගය, කැබලි අංක 53 (මාර්ගය) හා කැබලි අංක 49 (මාර්ගය) ;
   *දකුණට* : අංක 320301 දරන කැඩැස්තර සිතියමෙහි කැබලි අංක 49 (මාර්ගය) ;
   *බටහිරට* : අංක 320301 දරන කැඩැස්තර සිතියමෙහි අත්පත් කර ගැනීමට යෝජිත කැබලි අංක 51.

2. කැබලි අංක : 2
   ඉඩමේ ප්‍රමාණය : පර්චස් 13.3

   *උතුරට* : අංක 320301 දරන කැඩැස්තර සිතියමෙහි කැබලි අංක 53 (මාර්ගය) ;
   *නැගෙනහිරට* : අංක 320301 දරන කැඩැස්තර සිතියමෙහි අත්පත් කර ගැනීමට යෝජිත කැබලි අංක 50 ;
   *දකුණට* : අංක 320301 දරන කැඩැස්තර සිතියමෙහි කැබලි අංක 49 (මාර්ගය) ;
   *බටහිරට* : අංක 320301 දරන කැඩැස්තර සිතියමෙහි අත්පත් කර ගැනීමට යෝජිත කැබලි අංක 52.

3. කැබලි අංක : 3
   ඉඩමේ ප්‍රමාණය : පර්චස් 14.6

   *උතුරට* : අංක 320301 දරන කැඩැස්තර සිතියමෙහි කැබලි අංක 53 (මාර්ගය) ;
   *නැගෙනහිරට* : අංක 320301 දරන කැඩැස්තර සිතියමෙහි අත්පත් කර ගැනීමට යෝජිත කැබලි අංක 51 හා කැබලි අංක 49 (මාර්ගය) ;
   *දකුණට* : අංක 320301 දරන කැඩැස්තර සිතියමෙහි කැබලි අංක 56 ;
   *බටහිරට* : අංක 320301 දරන කැඩැස්තර සිතියමෙහි කැබලි අංක 55 හා 53 (මාර්ගය).

4. කැබලි අංක : 4
   ඉඩමේ ප්‍රමාණය : පර්චස් 7

   *උතුරට* : කැඩැස්තර සිතියමේ අංක 320301 හි කැබලි අංක 50 හා 51 ;
   *නැගෙනහිරට* : ප්‍රාදේශීය සභා මාර්ගය හා කැබලි අංක 53 (මාර්ගය) ;
   *දකුණට* : කැඩැස්තර සිතියමේ අංක 320301 හි කැබලි අංක 47, 48 හා 56 ;
   *බටහිරට* : කැඩැස්තර සිතියමේ අංක 320301 හි කැබලි අංක 52.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 24 වැනි දින,
බත්තරමුල්ල, පැලවත්ත,
නව පාර්ලිමේන්තු පාර,
අංක 35හි පිහිටි
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1302

11 - 1127

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.